චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය - 2021
---------------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, භාරයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථා භාරයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව

සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, භාරය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුලදී භාරය විසින් එකතුව රු.**10,179,613** ක පිරිවැයකට මිලදී ගත් මුහුණත වටිනාකම රු.**9,083,524** ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර **02** කට අදාල රු.**1,096,089** ක් වූ මුළු භාණ්ඩාගාර බැඳුම්කර පාඩුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල රු.**239,801** ක් වූ බැඳුම්කර පාඩුව වර්ෂයේ ලාභයට කපා හැරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් සහ ආයෝජන වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වර්ෂයට අදාල බැඳුම්කර පාඩුව ලාභයට කපා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) භාණ්ඩාගාර බිල්පත් කල් පිරීමේදී ලැබී තිබූ පෙර කාලසීමාවට අදාල රු.**30,055** ක පොලි මුදල සාවද්‍ය ලෙස ඉදිරියට ලැබූ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල රු. **68,296** ක්වූ ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලිය ගිණුම්ගත කර නොතිබුණි. | භාණ්ඩාගාර බිල්පත් පොළිය කලින් ලැබුණා සේ සලකා ගිණුම් තැබීම තුල මෙලෙස දක්වා ඇත. ඉදිරියේදී ඔබ පෙන්වා දී ඇති පරිදි සටහන් කිරීමට කටයුතු කරනු ඇත. | වර්ෂයට අදාල භාණ්ඩාගාර බිල්පත් පොලිය නිවැරදිව ගණනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ඉදිරියට ලැබූ භාණ්ඩාගාර බැඳුම්කර පොලිය රු.**12,633** ක් වුවත් මූල්‍ය ප්‍රකාශන තුල එය රු.**57,128** ක් ලෙස දක්වා තිබීමෙන් ඉදිරියට ලැබූ භාණ්ඩාගාර බැඳුම්කර පොලිය රු.**44,494** කින් වැඩියෙන් හා ආයෝජන පොලී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වර්ෂයට අදාල බැඳුම්කර පොලිය නිවැරදිව ගණනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩාගාර බිල්පත් පොලිය රු. 193,567 ක් වුවද එය රු.144,141 ක් ලෙස ගිණුම් ගත කර තිබීමෙන් වර්ෂයේ ආදායම රු. 49,426 ක් අඩුවෙන් දැක්වුණි | ගිණුම් තැබීමේ ක්‍රමවේදයෙහි වෙනස සහ අවසන් කාලපරිච්ඡේදයේ පොළී ප්‍රතිශතයෙහි වූ වැඩිවීම මත මෙම වෙනස සිදුව ඇත. තවද ඉදිරියේදී ඔබ පෙන්වා දී ඇති පරිදි සටහන් කිරීමට කටයුතු කරනු ඇත. | වර්ෂයට අදාල බිල්පත් පොලිය නිවැරදිව ගණනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |

**1.5.2** අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතේ 6(2)(ඉ) වගන්තියට අනුව මුදල් අයෝජන කිරීමේදී මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවද, 2021 ජනවාරි 22 දින භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබූ රු.5,000,000 ක් වූ මුදල සඳහා මණ්ඩලයේ අනුමැතිය ගෙන නොතිබුණි. | භාරකාර මණ්ඩල ආවරණ අනුමැතියට යටත්ව සභාපති අනුමැතියෙන් මෙම ආයෝජන සිදු කර ඇති අතර සියළු ආයෝජනයන් සඳහා භාරකාර මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. | පනතේ විධිවිධානවලට අනුව මුදල් අයෝජන කිරීමේදී භාරකාර මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.3** විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| රුක්මණී දේවී අරමුදල | 462,778 | ඉටු කළයුතු අරමුණු හා කාර්යයන් පිළිබඳ ලිඛිත තොරතුරු හා සාක්ෂි | මෙම කරුණ සම්බන්ධව පැහැදිලි කිරීම් සඳහා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි සොයා ගැනීමට නොහැකි වී ඇත. | මෙම අරමුදල පිහිටුවීමට අදාල අරමුණු පිළිබඳ සොයා බලා ඒ අනුව ක්‍රියාකළ යුතුය. |

**1.6** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)1986 අංක 03 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනත | | | |

| | | | |
|---|---|---|---|
| i. 02 ඡේදය | චිත්‍රපට සංස්ථා භාරයේ නාමයෙන් සංස්ථාවක් වියයුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු වුවද භාරය පිහිටුවා ගත වූ වසර 37 ක කාලයක තුල එවැනි මුද්‍රාවක් භාරයේ පවතින බව විගණනයේදී තහවුරු නොවීය. | ජාතික චිත්‍රපට සංස්ථා භාරය වෙත පොදු මුද්‍රාවක් ආරම්භක අවධියේ පැවතියද කාර්ය මණ්ඩල වෙනස් වීම් තුල දැනට එවැනි මුද්‍රාවක් සංස්ථා භාරය සතු නොවීම කෙරෙහි අවධානය යොමු කර පොදු මුද්‍රාවක් සකස් කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| ii. 3(1) වගන්තිය | භාරයෙහි පරිපාලනය, කළමනාකරණය සහ පාලනය සඳහා භාරකාර මණ්ඩලයක් පත් කළ වුවත් 2012 නොවැම්බර් 30 දින සිට 2021 ජූලි 06 දින දක්වා වසර 08 කුත් මාස 07 ට ආසන්න කාලයක් සඳහා භාරකාර මණ්ඩලයක් පත්කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| iii.06(2)ඇ ඡේදය | භාරයේ නිලධාරීන් හා සේවකයින් පත් කිරීම හා සේවයේ නියුක්ත කිරීම පාරිශ්‍රමික ගෙවීම ආදී කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම කලයුතු වුවද භාරය ක්‍රියාත්මක වූ දින සිට මේ දක්වා එසේ රීති සෑදීමක් හෝ භාරයේ කටයුතු සිදු කිරීම සඳහා නිලධරයන් හා සේවකයින් බඳවාගැනීමක් සිදු කර නොතිබූ අතර චිත්‍රපට සංස්ථාවේ නිලධාරීන් සහ සේවකයින් භාරයේ කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. සංස්ථා භාර අරමුදලෙහි මූල්‍ය තත්ත්වය භාරයේ ප්‍රධාන පරමාර්ථ හෝ ඉටු කිරීමට ආරම්භයේ සිටම ප්‍රමාණවත් නොවීම තුල මෙහි රාජකාරි කටයුතු සේවා අවශ්‍යතාවය මත ජාතික චිත්‍රපට සංස්ථා කාර්ය මණ්ඩල නිළධාරින් මඟින් සිදු කර ගැනීමට පාලනාධිකාරි විසින් කටයුතු කර ඇත . | පනතේ විධිවිධාන අනුව මෙම අරමුණු ඉටුකිරිමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

**සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 113,069 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,884 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 102,185 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විශ්‍රාම දීමනා රු.695,000 කින් හා ආදායම් රු.580,312 කින් අඩුවීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.**

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථා භාරය පිහිටුවා විගණිත දින වන විට වසර 37 කට ආසන්න කාලයක් ගත වී ඇති අතර භාරය ආරම්භක තත්ත්වයේම හෝ වඩා අඩු ක්‍රියාකාරී මට්ටමකින් භාරයේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර පනතේ දක්වා ඇති පරමාර්ථ අතරින් කලාකරුවන්ට සහ කාර්මිකයන්ට දායක විශ්‍රාම වැටුප් මුදල් ගෙවීම පමණක් සිදු කර තිබූ අතර පවතින ආර්ථික තත්ත්වයන්ට අනුකූලවන පරිදි විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීම, පොරොත්තු ලේඛනගත විශ්‍රාමලාභීන්ට කඩිනමින් විශ්‍රාම වැටුප් පිරිනැමීමට සහ සුභසාධන වෛද්‍ය පහසුකම් ලබාදීම ආදී කිසිදු කර්තව්‍යයක් භාරය මඟින් සිදු නොවන බව නිරීක්ෂණය විය. | සංස්ථා භාරය පිහිටුවීමෙන් පසු ආරම්භක අවස්ථාවේදී සංස්ථා භාර අරමුදල වෙත කරන ලද මූල්‍ය පරිත්‍යාග ස්ථාවර, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර තැන්පතු වශයෙන් පවත්වාගෙන යැමෙන් ලද පොළී මුදල සහ ජාතික චිත්‍රපට සංස්ථාව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන මූල්‍ය දායකත්වය පමණක් සංස්ථා භාර අරමුදලෙහි ආදායම් තත්ත්වය ලෙස පැවතීමත්, මෙහි අරමුදල් තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා අවස්ථා ගණනාවකදීම විවිධ යෝජනා ක්‍රියාත්මක කිරීමට යැමේදී ප්‍රයෝගික ගැටළු රැසකට මුහුණ පෑමට සිදු වීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවීම තුල එම යෝජනා අසාර්ථක වීමෙන් සංස්ථා භාරයෙහි ප්‍රධාන පරමාර්ථ අතුරින් සුදුසුකම්ලාභී චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන් වෙනුවෙන් මාසික විශ්‍රාම වැටුප් දීමනාව පමණක් පිරිනැමීම සිදුව ඇත. | අරමුදල් තත්ත්වය වැඩි දියුණු කර ගැනීමටත් භාරයෙහි පරමාර්ථයන් ඉටු කිරිමටත් පියවරගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1වගන්තියෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඈ) ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත ඒ ඒ අරමුදල පිළිබඳ සහතික කළ මූල්‍ය ප්‍රකාශනද සමග කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2023 අප්‍රේල් 25 දින වන අතර ඒ සමග කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුල ලොව පුරා පැතිරී ගිය කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වසරෙහි පත්වන ලද නව භාරකාර මණ්ඩලය ද ක්‍රියාත්මක වීම සිදු වුයේද ප්‍රමාද වීම තුල සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමාද වීමත් කාර්ය සාධන වාර්තාව යොමු නොකිරීමට හේතු විය. | චක්‍රලේඛ විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කිරිමට කටයුතු කළ යුතුය. |

**4.2** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(ඊ) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් හෝ ගණන්දීමේ නිලධාරියා විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු වුවත් භාරය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කිරිමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. | පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කිරිමට කටයුතු කළ යුතුය. |

**4.3** විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) වගන්තිය ප්‍රකාරව අදාල ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් හෝ ගණන්දීමේ නිලධාරියා විසින් හෝ අදාළ පාලක මණ්ඩලය විසින් තමාට සහාය දීම පිණිස පත් කරනු ලබන විගණන හා කළමනාකරණ කමිටුවක් තිබිය යුතු වුවත් එවැනි කමිටුවක් පත් කර නොතිබුණ අතර 2021 වර්ෂය තුළදී භාරය විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමටද කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. | පනත ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

**4.4** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 වගන්තියෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 877(1)(ඇ) ප්‍රකාරව 2021 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2013 වසරෙහි සිට 2021.05.21 වන දින දක්වාම භාරකාර මණ්ඩලයක් පත් නොවීම තුල චිත්‍රපට සංස්ථා භාරයෙහි ප්‍රධානතම පරමාර්ථයන්ට අනුකූලව 2021 වසරට අදාල අයවැය ලේඛනය සකස් කර නිසි අනුමැතීන් සහිතව 2020 වසර තුල ඉදිරිපත් කිරීමට නොහැකි විය. | චක්‍රලේඛ විධිවිධාන අනුව වාර්ෂිකව අයවැය ලේඛනයක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |